ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPE2815/ESC2315 -** මුල් ළමා වියෙහි සංවර්ධනය

කාලය - පැය තුනයි. (03)

දිනය - 2023.06.24 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

පළමුවන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

<u>පළමු වන කොටස</u>

01. කායික සංවර්ධනය පිළිබඳ මූලධර්ම තුනක් (03) නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "පරිනතිය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "පූර්ව ප්‍රසව වර්ධනය"යනු කුමක් ද? ඒ කෙරෙහි බලපාන සාධක තුනක් (03) නම් කරන්න.

04. "තැත් වරද ක්‍රමය" යන සංකල්පය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

05. පෙරපාසල් අවධියේ ළමයින්ගෙන් ප්‍රකටවන "සුවිශේෂී චිත්තවේග " හතරක් (04) නම් කරන්න.

06. පෙරපාසල් අවධියේ දි ළමයින් පෙන්නුම් කරන "සමාජීය නොවන වර්යා රටාවන්" හතරක් (04) නම් කරන්න. ඉන් එක් චර්යාවක් හේතු දක්වමින් පැහැදිලි කරන්න.

07. කුඩා ළමයින්ගේ "ඉගෙනුම් උපාය මාර්ග" තුනක් (03) පිළිබඳ ව උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. පෙරපාසල් අවධියේ ළමයින්ගේ "භාෂා සංවර්ධනය" කෙරෙහි බලපාන සාධක පහක් (05) නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) ළමා සංවර්ධනයට අදාලව **"පූර්ණ සංවර්ධනය"** යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ යහපත් චිත්තවේගීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා පෙරපාසල් ගුරුවරියට මැදිහත් විය හැකි ආකාරය උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) ළමා චර්යා අධ්‍යයනයට සුදුසු **"ශිල්පීය ක්‍රම "** තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ඉහත සඳහන් කරන ලද එක් ශිල්පීය ක්‍රමයක් සිසුන් අධ්‍යයනය සඳහා භාවිත කරන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) ජීන් පියාජේ විසින් ඉදිරිපත් කරන ලද බුද්ධි සංවර්ධන න්‍යායයෙන් දක්වන දරුවන්ගේ බුද්ධි සංවර්ධනයේ අවධි හතර **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පියාජේගේ න්‍යාය පාදක කර ගනිමින් ඔබ පෙරපාසල් දරුවන්ගේ බුද්ධි සංවර්ධනය සුසාධ්‍යකරණය කරනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) සිසුන්ගේ ශරීර ප්‍රමාණයේ විවිධතා කෙරෙහි බලපාන සාධක පහක් **(05)** තර්කානුකූල ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ළමයින් තුළ "මනෝචාලක කුසලතා" සංවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියක විසින් සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් **(04)** පියවර වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පෙරපාසල් පන්තිකාමරයක් තුළ යහපත් සමාජීය චර්යා රටා දක්වන ළමයින් පෙන්නුම් කරන යහපත් චර්යා උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ළමයින් තුළ යහපත් සමාජීය චර්යා රටා සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරිය කටයුතු කළයුතු ආකාරය තර්කානුකූල ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.